"මං මේ කියන දේ ඔයාට තේරුම් ගන්න පුලුවන්ද මන්දා.." ටීපෝව මත වූ තේ කෝප්පයේ දාරය වටා දකුණතේ දබරැගිල්ල යවමින් අමන්දා කීවා ය. "..මගේ අසනීපෙ දැනගත්ත දා ඉඳලා මං උත්සාහ කළේ ජීවිතෙන් පැනලා යන්න.. මං දැනගෙන හිටියා කොයියම්ම හෝ වෙලාවක මට මේ ජීවිතේ අතඇරලා යන්න වෙන බව.." අමන්දා කතාව නවතා මොහොතක් නිහඬ වූවා ය. තමා දෙස එක එල්ලේ බලා සිටිනා ඔහුගේ දෑස් මගහරිමින් බිම බලාගත් ඈ සුසුමක් හෙලුවා ය. "... මං උත්සාහ කළේ ඔයාල හැම දෙනාම අතඇරලා යන්න හිත හදාගන්න.. මං නොකිව්වත් ඔයා ඒක දන්නවා.. මං ඒ අරමුණ දිනාගත්තා නිමන්ත .. මං ඔයාල අතඇරලා යන්න හිත හදා ගත්තා.. මං මේ ලෝකෙන් ම අයින් වෙලා චිත්‍ර අඳින්න ගත්තා.. මට ඔයාල හැම කෙනෙක්ම අමතක කරන්න පුලුවන් වුණා.. මං දුකෙන් නෙවෙයි හිටියෙ.. සතුටෙනුත් නෙවෙයි හිටියෙ.. ඔයාල අමතක කිරීමේ මගේ උත්සාහය මං දිනලයි හිටියෙ.. ඒත්.. ඒත් ඒ ගමනේ කෙළවරදි මං පැරදුණා නිමන්ත .." ඇය කතාව නවතා දෑසින් කලා ආ කඳුලු බිඳු පිටි අත්ලෙන් පිසදා ගත්තා ය.

"මට ඔයාට පෙන්නන්න යමක් තියෙනවා. " ඇය නැගිට ගොස් තමා අවසන් වරට නිමැවූ සිත්තම ගෙන ආවා ය.

බව ඔහු දැන සිටියේ ය. අසන්නට ඇති සියල්ල සිතේ තබාගත්වන ම දැනගන්නට ඇති සියල්ල දැනගන්නට උත්සාහ නොකර ම ඔහු ඇය පිළිබඳ උපන් අසීමිත අනුකම්පාවෙන් බලා සිටියේ ය. ඇයට ජීවත්වන්නට ශක්තියක් වනවා වෙනුවට ආත්මාර්ථය පෙරට දමාගන්නට ඔහු කිසිදු උත්සාහයක් නොගත්තේ ය.

අමන්දා බොහෝ වේලාවකට පසු හිස ඔසවා ඔහු දෙස බැලුවා ය. ඉතා සීරුවෙන් ඔහුගේ ග්‍රහණයෙන් සිය දෑත් මුදවා ගත් අමන්දා වාඩිවන්නැයි ඔහුට අභිනයෙන් කීවා ය. ඔහු සෝපාවේ ඇය අසළින් ම වාඩි වූණේ ය.

"...මං දැන් කරගෙන යන ට්‍රීට්මන්ට්ස් නවත්තනවා නිමන්ත .. මේ ට්‍රීට්මන්ට්ස් ගැන මගේ හිතේ කිසිම විශ්වාසයක් කවදාවත් තිබුණෙ නැහැ.." ඈ කීවා ය.

"ඉතින් දැන් මොකක්ද ඔයා කරන්න යන්නෙ..?"

"මගේ හිතේ විශ්වාසයක් ඇති කළ වෛද්‍ය ක්‍රමයකට යොමු වෙන්න.. හැමෝම හිතන විදිහට ඔයත් හිතයි ඒක රිස්කි වැඩක් කියල ... ඒක රිස්ක් එකක් නම් මං ඒ රිස්ක් එක ගන්නවා නිමන්ත .. ඒ ටික ඔයාට

## *අද මං ජීවිතේට ආදරයි නිමන්ත...*
## *මට දැන් ආයෙම ජීවත්වෙන්න ඕනෙ..*

කියන්නයි මට ඕනෙ වුණේ.."

ඔහු සුසුමක් හෙළණු ඇයට ඇසුණි.

"අමා.." ඔහු උකුළ මත වූ ඇගේ දෑත් මත සිය වමත තැබුවේ ය. ".. ඔයා දන්නවා අමා ඔයා මගෙන් ඈත් වෙලා යද්දිත් මං ඔයා වළක්වන්න එක වචනයක් වත් කිව්වෙ නැහැ.. මං එකම එක ප්‍රශ්නයක් වත් ඔයාගෙන් ඇහුවෙ නැහැ.. මං ඔයාට ඉඩ දීල බලාගෙන හිටියා.. දුකත් වේදනාවත් හිතේම තියාගෙන මං බලාහිටියා.. අදත් මං ඔයාගෙන් එක ප්‍රශ්නයක්වත් අහන්නෙ නැහැ අමා.. ඔයා යන්න යන ගමන එක හිතින් යන්න.. සතුටින් යන්න.. මං ඒ ගමනට බාධාවක් වෙන්නෙ නැහැ.. ඔයා කැමතිවුණත් නොවුණත් මට කරන්න පුලුවන් හැම දෙයක්ම මං ඔයා වෙනුවෙන් කරනවා.. ඔයාට හොඳක් වෙනව නම් ඈත ඉඳන් බලා ඉඳලා සතුටුවෙන්න මට පුලුවන්.."

ඈ සිනාසුණා ය. කලකට පසු දුටු ඇගේ සුන්දර සිනාව ඔහු සිතේ අති මහත් සතුටක් ඇති කළේ ය.

"තැන්ක් යූ නිමන්ත .." අමන්දා ඒ සිනාව අතරින් ම කීවා ය. ".. නැතිවෙන්න ගිය ජීවිතේ මං කොහොම හරි ආපහු දිනා ගන්නවා.. සත්තයි නිමන්ත .. මං කොහොම හරි ජීවිතේ දිනා ගන්නවා.."

0000000000

අමන්දා ගේ ඇඳුම් බෑග දෙක නිමන්ත අතින් ගත් විශ්වජිත් එය වාහනයට පටවාගත්තේ ය.

"බලාපොරොත්තු නැතිකරගන්න එපා.. මට විශ්වාසයි අමා මේ උත්සාහයෙන් දිනනවා කියන එක.." ඔහු කීවේ නිමන්ත ගේ දෙවුර මත තබා ගත් දෑතින් යුතුව ය. නිමන්ත සිනාසුණේ ය. ඔහු ගේ දෑසග කඳුළක් රැඳී තිබෙණු විශ්වජිත් දුටුවේ ය.

"මේක තමයි මං අන්තිමට ෆිනිෂ් කළ පේන්ටිං එක..." ඈ සිත්තම නිමන්ත අත තැබුවා ය. " ..මං මේක ඊයේ විශ්වජිත්ගෙන් ආපහු ඉල්ගෙන ආවා.. ඔයාට පේනවද. .? මේ කන්ද උඩ එක ගහයි තිබුණෙ... එතැන තව ගහක තිබිල තියෙනවා. . පස්සෙ කාලෙක මැරිලා ගිහින්.. මං ඒ ගහ එතැන අලුතෙන් ඇන්දා.. ඒකෙන් මගේ හිතට ඇතිවුණේ පුදුම සතුටක්.. විනාශ වෙච්ච යමක් නැවත ගොඩනැගුවාම ඕනෙම කෙනෙකුට ඒ වගේ සතුටක් දැනෙනවා ඇති. . . ජීවිතේ අපි උත්සාහ කරන්න ඕනෙ ඒක තමයි කියන එක මං දැන් දන්නවා. . විනාශකිරීම නෙවෙයි... ගොඩ නැගීම.. විනාශවීම නෙවෙයි.. ජීවත්වීම.. අද මං ජීවිතේට ආදරයි නිමන්ත... මට දැන් ආයෙම ජීවත්වෙන්න ඕනෙ.."

නිමන්ත මහත් විමතියකින් මොහොතක් ඇය දෙස බලා සිටියේ ය. අනතුරුව ඔහු ඉදිරියට ඇදී ඇය ඉදිරියේ දණගසාගත්තේ ය. දෑතින් ම ඇගේ දෑත් අල්ලා ගත් ඔහු ඈ දෙස හිස ඔසවා බැලුවේ ය.

"ඔව් අමා.. ඔයා ජීවත්වෙන්න ඕනෙ.." ඔහු කියනු දෑස් වසා සිටි ඇයට ඇසුණි. සිය දෑත් තරයේ අල්ලාගත් ඔහුගේ දෑත්මත හිස තබාගත් අමන්දා ඉකිබින්දා ය. ඇයට හඬන්නට ඉඩ දී ඔහු නිහඬව බලා සිටියේ ය.

එකම ආරම්මණයක සිත රන්දා ගනිමින් ඉදිරියට ගිය ඇය අංශක එකසිය අසූවකින් ආපසු හැරෙන්නට හේතුව කුමක්දැයි දැනගන්නට ඔහුගේ යටි සිත පොර බැදුවේ ය. යම්කිසිවකු ජීවිතය පිළිබඳ ආශාව ඇගේ සිතේ නැවත ඇති කළේ ද ඒ තමා නොවන







අමන්දා සැරසී සිටියේ මල් වැටුණ දීප්තිමත් ඇඳුමකිනි. ඒ ඇඳුම ඇගේ රුව වඩාත් සුන්දර කර තිබුණි. ගෙදරින් පිටවන්නට පෙර ඈ නිමන්ත ගේ දෙපා වැන්දා ය.

"කවදාහරි වරදක් වුණා නම් සමාවෙන්න.." ඈ කීවා ය.

ඔහු ඇගේ දෙවුරින් අල්ලා නැගිට්ටෙව්වේ ය. ඉතා සීරුවෙන් ඇගේ නළලත හාදුවක් තැබුවේ ය.

"සතුටින් යන්න.." ඔහු කීවේ ය.

ඔහු දෙස හිස ඔසවා බැලූ අමන්දා විශ්වජිත් ගේ වාහනයට ගොඩවූවා ය. වාහනය පිටත්ව යන තෙක් නිමන්ත දොරකඩ සිට බලා සිටියේ ය. අපේක්ෂා භංගත්වය වැනි හැඟීමක් ඔහුගේ සිත පෙළා දමමින් ගොඩ ගැසුණි. සිත රිදවන හැඟීම් අතරේ ඊර්ෂ්‍යාවක් ද ඇතැයි ඔහු දනියි. සියල්ල දෙස උපේක්ෂාවෙන් බලා සිටීමේ දුෂ්කර ක්‍රියාවේදී තමා දිනනු ඇතිද නැත්නම් පරදිනු ඇතිද යන්න තීරණය කරගත නොහැකිව ඔහු අසරණව සිටියේ ය. හැඟීම් පරදා බුද්ධියට දිනන්ට ඉඩ දෙන්නට තමාට හැකි වේදැයි ඔහු සිතුවේ ය..

ආපසු හැරුණ නිමන්තට අමන්දා අවසන් වරට නිමකළ සිත්තම සෝපාව මත තිබෙණු පෙනුණි. ඔහු එය මහත් ඕනෑකමකින් අතට ගත්තේ ය. බිත්තියේ හොඳින් පෙනෙන තැනක එය රැඳවූ ඔහු ඈත සිට එදෙස බලා සිටියේ ය. එය සැබැවින්ම අපූරු සිත්තමක් යයි ඔහුට සිතුණි.

0000000

අමන්දා ආරණ්‍ය සේනාසනයට යන රළු ගල් පඩි එකින් එක නගිමින් සිටියා ය. අනවරත රැහැයි ගීතය අතරින් කොවුලකු කෑ ගසන හඬ අමන්දාට ඇසුණි. ඇය පඩි නැගීම නවතා ඒ කන්කලු හඬ අසා සිටියා ය.

"මහන්සිද..?" ඇයට ඉහළ පඩියේ සිටි විශ්වජිත් ඇසුවේ ය.

"නැහැ.." අමන්දා සිනාසී කීවා ය.

ඔහු ඉහළ පඩියේ සිට ඇයට තම සුරත දිගු කළේ ය. ඈ මහත් ඕනෑ කමකින් ඒ අත අල්ලා ගත්තා ය.

"යමු.." ඔහු කීවේ ය.

"යමු.." ඈ කීවා ය.

"Life is an opportunity, benefit from it.
Life is beauty, admire it.
Life is a dream, realize it.
Life is a challenge, meet it.
Life is a duty, complete it.
Life is a game, play it.
Life is a promise, fulfill it.
Life is sorrow, overcome it.

Life is a song, sing it.
Life is a struggle, accept it.
Life is a tragedy, confront it.
Life is an adventure, dare it.
Life is luck, make it.

Life is too precious, do not destroy it.
Life is life, fight for it."

**Mother Teresa**

**පිනි නිම යි**







